# දෙවන වාර පරීක්ෂණය - 2019

| නර්තනය I | 13 ශ්‍රේණිය |
|---|---|
| නම / විභාග අංකය :- .............................................................................. | පැය 02 යි. |
| පන්තිය :- ............................ | |

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.
- අංක 01 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුල ලියන්න.

01. අනු පිළිවෙලින් උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම ඇතුළත් වරණය කුමක්ද?
   1. කඩවර කංකාරිය, කිරිමඩුව, ගම්මඩුව
   2. කොහොඹාකංකාරිය, පහන් මඩුව, කිරිමඩුව
   3. වලියක් මංගල්‍යය, රටයකුම, කිරිමඩුව
   4. පහන් මඩුව, සන්නියකුම, කිරිමඩුව
   5. කිරිමඩුව, පහන් මඩුව, රටයකුම (......)

02. 6 වන පැරකුම්බා රජුගේ රෝ දුක් සහ සතුරු කරදර දුරු කරලීමට කොහොඹාකංකාරිය ශාන්තිකර්මය පැවැත්වූ යුගය කුමක්ද ?
   1. මහනුවර
   2. අනුරාධපුර
   3. පොළොන්නරු
   4. කෝට්ටේ
   5. ගම්පොළ (......)

03. මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නර්තනය කළ බව සඳහන් වන්නේ,
   1. ඉබන් බතූතාගේ වාර්තාවේය.
   2. රොබට් නොක්ස්ගේ වාර්තාවේ ය.
   3. ෆාහියන්ගේ වාර්තාවේ ය.
   4. ස්පිල් බර්ජන්ගේ වාර්තාවේ ය.
   5. ජෝර්ජ් කීට් වාර්තාවේ ය. (......)

04. "දොංත ගතම් දොංත ගති ගතම්" යන බෙර පදයෙන් සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,
   1. මුදලිය
   2. ජසයාය
   3. නොංචිය
   4. ලෙංචිනාය
   5. අණබෙර කරුය. (......)

05. උඩරට නැටුම් කලාව හා සිංහල නර්තන කලාව යන කෘති දෙක රචනා කරන ලද්දේ පිළිවෙලින්
   1. ජේ.ඊ. සේදරමන් සහ මුදියන්සේ දිසානායක විසිනි.
   2. තිස්ස කාරියවසම් සහ සරත් විජේවර්ධන විසිනි.
   3. තිස්ස කාරියවසම් සහ මුදියන්සේ දිසානායක විසිනි.
   4. ජේ.ඊ. සේදරමන් සහ නිමල් වෙල්ගම විසිනි.
   5. සරත් විජේවර්ධන සහ නිමල් වෙල්ගම විසිනි. (......)

06. මංගර සැහැල්ල, කිරි ඉතිරවීමේ කවි යන ගායනා අංග දක්නට ලැබෙන්නේ,
   1. රටයකුම ශාන්තිකර්මයේ ය.
   2. වලියක් මංගල්‍ය ශාන්තිකර්මයේ ය.
   3. කිරිමඩුව ශාන්තිකර්මයේ ය.
   4. කඩවර කංකාරිය ශාන්තිකර්මයේ ය.
   5. බලි ශාන්තිකර්මයේ ය. (......)

07. මේවා කොහොඹාකංකාරිය හා වලියත් මංගල්‍යය ශාන්තිකර්මයේ දක්නට ලැබෙන නාට්‍යමය අවස්ථා කිහිපයකි.
   1. ඌරා යක්කම, ඇත් බන්ධනය, ආඩිගුරු නැටීම.
   2. වැදි යක්කම, නයා යක්කම, මහ යක්කම
   3. ආඩි ගුරු නැටීම, අඹ විදමන, මහ යක්කම
   4. ඌරා යක්කම, ඇත් බන්ධනය, නානුමුරය
   5. අසුර යක්කම, නයා යක්කම, මහ යක්කම (......)

08. රස භාව පිළිබඳ අදහස් දැක් වූ අපරදිග මතවාදීන් වන්නේ,
1. භරතමුනි සහ ඇරිස්ටෝටල් ය.
2. භරතමුනි සහ ධනංජය ය.
3. නන්දිකේශ්වර සහ ප්ලේටෝ ය.
4. අභිනවගුප්ත සහ ඇරිස්ටෝටල් ය.
5. ඇරිස්ටෝටල් සහ ප්ලේටෝ ය. (......)

09. "ලෙලදුන් නව තඹ පලුවන් පාදේ" සහ බරත සතර පෙර ඉසිවර කී ලෙසට" යනු කවි දෙක ලියවී අත්තේ,
1. ගම්පල යුගයට අයත් මයුර හා තිසර සංදේශකාව්‍ය වලය.
2. දඹදෙණි යුගයට අයත් මයුර හා කෝකිල සංදේශ කාව්‍ය වලය.
3. කෝට්ටේ යුගයට අයත් හංස සහ සැවුල් සංදේශ කාව්‍ය වලය.
4. කෝට්ටේ යුගයට අයත් සැළලිහිණි සහ සැවුල් සංදේශ කාව්‍ය වලය.
5. කෝට්ටේ යුගයට අයත් පරෙවිය සහ සැවුල් සන්දේශ කාව්‍ය වලය. (......)

10. අනු පිළිවෙලින් කාලි යාම, දරු නැළවිල්ල සහ කෝල සන්නිය අයත් ශාන්තිකර්ම පෙළ තෝරන්න.
1. දොවොල් මඩුව, සූනියම, සන්නියකුම
2. වලියක් මංගල්‍යය, රටයකුම, සන්නියකුම
3. පහන් මඩුව, රටයකුම, සන්නියකුම
4. කිරිමඩුව, සූනියම, රටයකුම
5. කොහොඹාකංකාරිය, සූනියම, සන්නියකුම (......)

11. කැළණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධව තිබූ සෞන්දර්ය අධ්‍යාපන ආයතනය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය නමින් ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත් වූයේ කුමන වර්ෂයේ දී ද?
1. වර්ෂ 1995 දී ය.
2. වර්ෂ 2003 දී ය.
3. වර්ෂ 2005 දී ය.
4. වර්ෂ 2006 දී ය.
5. වර්ෂ 2004 දී ය. (......)

12. කර්ණාට තාල පද්ධතියේ ඛණ්ඩ ජාති තාලය සමාන වන්නේ දේශීය තාල පද්ධතියේ,
1. මාත්‍රා 2 + 3 තාල රූපයට ය.
2. මාත්‍රා 3 + 4 තාල රූපයට ය.
3. මාත්‍රා 2 + 2 + 3 තාල රූපයට ය.
4. මාත්‍රා 3 + 3 තාල රූපයට ය.
5. මාත්‍රා 2 + 4 තාල රූපයට ය. (......)

13. පීටර් චෙකොව්ස්කි විසින් සංගීතවත් කළ බැලේ නාට්‍ය තුනක් වන්නේ,
1. හංස විල, නැට්ක්‍රැකර් හා ගිසෙල්ලිය
2. හංස විල, රෝමියෝ ජුලියට් හා ගිසෙල්ලිය
3. හංසවිල, නට්ක්‍රැකර් හා නිදිකුමරිය
4. හංසවිල, පෙට්රුෂ්කා හා ගිසෙල්ලිය
5. හංසවිල, පෙට්රුෂ්කා හා නිදිකුමරිය (......)

14. මෙහි දැක්වෙන අනු පිළිවෙල අනුව ශෘංගාර, වීර, අද්භූත බීභත්ස්‍යා රසයනට මූලික වන භාවයන් තෝරන්න.
1. රතිය, නිර්භීත, උත්සහය, පිළිකුල
2. ශෘංගාර, වීර, පුදුම , භය
3. රතිය, උත්සහය, විශ්මය, පිළිකුල
4. කාම, වීර, පුදුම, පිළිකුල
5. කාම, උත්සහ, ආශ්චර්ය, භායනක (......)

15. මේවා මනිපුරි නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ වේ.
1. කොක්තුම්බි, කුමින්, පොෂ්වාන්
2. තුඩොෂ් කුමින්, නෙත්තිචුට්ටි
3. නෙත්ති චුට්, පොෂ්වාන්, ක්‍රීටම්
4. සෙනකුජි, මුකුත්ති, ගුංගුරු
5. විලංග, ගුංගුරු, ක්‍රීටම් (......)

16. වෙණ්ඩා, මද්දල නම් වූ අවනද්ධ භාණ්ඩ භාවිත කරනුයේ,
1. දේවදාසි නර්තනය තුළින් බිහි වූ භරත නාට්‍යම් සඳහා ය.
2. තාණ්ඩව ලක්ෂණ බෙහෙවින් දක්නට ලැබෙන කථකලි සඳහාය.
3. ලාසප ලක්ෂණ බහුලව දක්නට ලැබෙන මනිපුරි සඳහා ය.
4. උතුරු ඉන්දියාවේ ප්‍රචලිත කථක් නර්තනය සඳහා ය.
5. ඔරිස්සා ප්‍රදේශයේ දක්නට ලැබෙන ඔඩිස්සි සඳහා ය. (......)

17. "අපගේ මුණි රජාණන්" යන්නෙහි ඇති ලඝු හා ගුරු මත් ගණන කීය ද?
   1. ලඝු 09 හා ගුරු 02 කි.
   2. ලඝු 08 හා ගුරු 03 කි.
   3. ලඝු 05 හා ගුරු 04 කි.
   4. ලඝු 05 හා ගුරු 03 කි.
   5. ලඝු 04 හා ගුරු 03 කි. (......)

18. සංඛපාල හා දං උදියාගේ කතා පුවත් පසුබිම් වී ඇත්තේ කුමන ශාන්තිකර්මයේ ද ?
   1. උඩරට සම්ප්‍රදායේ කොහොඹාකංකාරියේ
   2. උඩරට සම්ප්‍රදායේ දෙවොල් මඩුවේ
   3. පහතරට සම්ප්‍රදායේ දෙවොල්මඩුවේ
   4. පහතරට සම්ප්‍රදායේ සන්නියකුම යාගයේ
   5. සබරගමු සම්ප්‍රදායේ කිරිමඩුවේ (......)

19. පරන්, චුම්රි, තරානා යන නර්තන අංග නාම දක්නට ලැබෙන්නේ,
   1. උත්තර භාරතීය මනිපුරි නර්තනයේ ය.
   2. උත්තර භාරතීය කථකලි නර්තනයේ ය.
   3. දක්ෂිණ භාරතීය කථක් නර්තනයේ ය.
   4. උත්තර භාරතීය කථක් නර්තනයේ ය.
   5. දක්ෂිණ භාරතීය කථකලි නර්තනයේ ය. (......)

20. ඉනේ සවඩි රන් කෙදිවන් - පයේ වළලු ගිගිරි ලවන්" මෙම කවිය ගායනය කරනු ලබන්නේ,
   1. කිරිමඩුව ශාන්තිකර්මයේදී ය.
   2. රටයකුම ශාන්තිකර්මයේදී ය.
   3. බලි ශාන්තිකර්මයේදී ය.
   4. සන්නියකුම ශාන්තිකර්මයේදී ය.
   4. කොහොඹාකංකාරිය ශාන්තිකර්මයේදී ය. (......)

21. කොහොඹාකංකාරිය ශාන්තිකර්මයේ දක්නට ලැබෙන සැරසිලි අංග කිහිපයක් වන්නේ,
   1. රටයකුම් වීදිය, අයිලය හා සූනියම් වීදියයි.
   2. අයිලය, යහන හා මුවය සහිත කෙසෙල් ගසයි.
   3. පත්තිරිප්පුව, කුමාර වීදිය හා පත්තිනි තොරණයි
   4. පුනා වීදිය, සූනියම් වීදිය හා යහනයි.
   5. දොවොල් තොරණ, අයිලය හා පුනා වීදියයි. (......)

22. බැලේ නර්තනය සඳහා මුල් යුගයේ අඳින ලද වළලුකර දක්වා දික් වූ ගවුම හඳුන්වන ලද්දේ,
   1. ක්ලැසික් ටුටු නමිනි.
   2. රොමැන්ටික් ටුටු නමිනි.
   3. බ්ලැසිස් ටුටු නමිනි.
   4. ස්කල්ෆේ නමිනි.
   5. ලියෝටාඩ් නමිනි (......)

23. සන්නියකුම් යාගයේදී වාලි වෙස් මුහුණත් පැළැඳ රතු වර්ණයෙන් සැරසී මුගුරක් අතැතිව රඟ මඩලට පිවිසෙන්නේ,
   1. මරු සන්නියයි.
   2. සූනියම් යක්ෂණියයි.
   3. රීරි යකා ය.
   4. කෝළ සන්නි යක්ෂයා ය.
   5. කළු යකා ය. (......)

24. ජිං කඩතක ජිං රුකුතක / ගතිත ගතම් දොම් / ජිං කිටිතත් තත් කිටිතන ඉහත සඳහන් බෙර පද වලට අදාළ තාල රූපය වන්නේ,
   1. මාත්‍රා 4 + 4 මහ තනි තිතය.
   2. මාත්‍රා 3 + 3 මැදුම් තනි තිතය.
   3. මාත්‍රා 2 + 3 සුළු මැදුම් දෙතිතය.
   4. මාත්‍රා 2 + 4 සුළු මහ දෙතිතය.
   5. මාත්‍රා 2 + 2 + 4 දෙසුළු මහ තුන් තිතය. (......)

25. කුමින් සහ රිසම් පුරිට් යන රංග වස්ත්‍රාභරණ භාවිතා කරනු ලබන්නේ,
   1. කථක් නර්තනයේදී ය.
   2. භරත නර්තනයේදී ය.
   3. කථකලි නර්තනයේ දී ය.
   4. මනිපුරි නර්තනයේදී ය.
   5. බැලේ නර්තනයේදී ය. (......)

- අංක 26 සිට 35 තෙක් ප්‍රශ්න වලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

26. කෝලම් නාටකය රඟ දක්වන රංග භූමිය ...................................... නමින් හැඳින්වේ.

27. දෑත් ඉහළට එසවීම, සිරුර ඉහලට එසවීම, උඩ පැනීම වැනි චලන හැසිරවීමේදී .................................. භාවිත වේ.

28. අද්‍යාතනයේ ඉතා ජනප්‍රිය හා ලෝකයේ ඉතා බහුලව භාවිතා වන්නේ ...................................... වේදිකාවයි.

29. භරත නාට්‍යම් සම්ප්‍රදායෙහි අංග රචනය ...................................... නමින් හඳුන්වයි.

30. බැලේ රංග කලාවේ නිජබිම ලෙස ...................................... හැඳින්විය හැකිය.

31. මුල් කාලීන ශ්‍රී ලාංකික වේදිකා පසුතල නිර්මාණකරණයේ දැවැන්ත චරිතයක් ලෙස ...................................... මහතා හඳුන්වා දිය හැකිය.

32. බැරිසිල් මුද්‍රා නාට්‍ය ...................................... මහතාගේ නිර්මාණයකි.

33. කොවුලා, තිසරා, ආනන්ද යන වන්නම් අයත් වන්නේ ...................................... නර්තන සම්ප්‍රදායටයි.

34. රුක්මණී දේවි අරුන්ඩේල් වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේ දක්ෂිණ භාරතයේ ................................ නර්තනය සඳහාය.

35. සිරුරේ උපාංග කොටස් මගින් කෙරෙන අදහස් ප්‍රකාශනය .................................. අභිනය යනුවෙන් හැඳින්වේ.

- අංක 36 සිට 50 තෙක් ප්‍රශ්න වලට අදාළ පිළිතුර තිත් ඉර මත ලියන්න.



36. මෙම ඡායාරූපයෙන් දැක්වෙන වාද්‍ය භාණ්ඩය එය හා බැඳි නර්තන සම්ප්‍රදාය නම් කරන්න.

(i) වාද්‍ය භාණ්ඩය ......................................  (ii) නර්තන සම්ප්‍රදාය ......................................

37. පහත සඳහන් නර්තනාංග අයත් වන්නේ කුමන සම්ප්‍රදාය වලටද?

(i) ශුද්ධ මාත්‍රය ......................................  (ii) යාදිනි මාත්‍රාය ......................................

38. කච්ච කෙට්ට අභ්‍යාසම් වලට හා තත්කාර් අභ්‍යාස වලට මූලික වන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

(i) කච්ච කෙට්ට ......................................  (ii) තත්කාර් ......................................

39. පහත සඳහන් සැරසිලි භාවිතා වන ශාන්තිකර්ම නම් කරන්න.

(i) උනුනු පියන ......................................  (ii) සොළොස් මහල ......................................

40. පහත සඳහන් ආයතන ආරම්භ වූ වර්ෂ මොනවාද ?

(i) රජයේ ලලිත කලායතනය ......................................  (ii) ගිරාගම ගුරු විදුහල ......................................

41. කථකලි නර්තන සම්ප්‍රදාය හා මනිපුරි නර්තනය උගන්වන ප්‍රධාන ආයතන මොනවාද ?

(i) කථකලි ....................................... (ii) මනිපුරි .......................................

42. සම්ප්‍රදායික නර්තන ශිල්පීන් මාත්‍රා 2 තනි තිත අඩ තනි තිත යනුවෙන් හැඳින්වූ අතර මාත්‍රා 3 සහ 4 හඳුන්වන ලද්දේ කුමන නම් වලින්ද ?

(i) ....................................... (ii) .......................................

43. "ද ඇකඩමි රෝයල් ඩාන්ස්" නර්තන පුහුණු පාසල බිහි වූ රට සහ එහි නිර්මාතෘ කවුරුන්ද ?

(i) රට - ....................................... (ii) නිර්මාතෘ - .......................................

44. රස විග්‍රහය ගැන දක්වා ඇති නාට්‍ය ශාස්ත්‍රය හා අභිනය දර්පණය නැමති කෘති රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?

(i) අභිනය දර්පණය ....................................... (ii) නාට්‍ය ශාස්ත්‍රය .......................................

45. කපුයක්කාරිය සහ අභිමාන යකා රංගනය කෙරෙන ශාන්තිකර්ම දෙක නම් කරන්න.

(i) කපුයක්කාරිය ....................................... (ii) අභිමන යකා .......................................

46. චිත්‍රසේන මහතාගේ මුද්‍රා නාට්‍ය සඳහා සංගීතයෙන් දායක වූ ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න.

(i) ....................................... (ii) .......................................

47. භරත හා කථකලි නර්තන සම්ප්‍රදායන්වල ගුරුවරු හඳුන්වනු ලබන්නේ කවර නම් වලින්ද ?

(i) භරත - ....................................... (ii) කථකලි - .......................................

48. ගත් නිකාස් සහ රාස් නර්තන අංග අයත්වන නර්තන සම්ප්‍රදායන් දෙක ලියන්න.

(i) ගත් නිකාස් - ....................................... (ii) රාස් නර්තන - .......................................

49. ගිනි සිසිල හා දේව කෝල් පාඩුව නර්තන අංග දක්නට ලැබෙන ශාන්තිකර්ම මොනවාද ?

(i) ගිනි සිසිල - ....................................... (ii) දේව කෝල් පාඩුව - .......................................

50. පහත සඳහන් පුද්ගලයින් දායකත්වය ලබාදුන් නර්තන සම්ප්‍රදායන් මොනවාද ?

(i) ශ්‍රී මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි .......................................

(ii) වල්ලතෝල් නාරායන මෙනන් .......................................